# ශ්‍රී ලංකාව සහ තමිල්නාඩුව අතර අවබෝධතාව තවත් ඉදිරියට



ශ්‍රී ලංකාව සහ තමිල්නාඩු ප්‍රාන්තය සමග ඇති සබඳතා ශක්තිමත් කරන තවත් සාකච්ඡා වටයක් ඇරඹේ. ඉකුත් ජුනි මස මුල ප්‍රධාන අමාත්‍ය එම්.කේ. ස්ටාලින් මහතා හමුවූ ඉන්දියාවේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් මිලින්ද මොරගොඩ මහතා, තූත්තුකුඩි මැතිවරණ කොට්ඨාසයේ ලෝක් සභා මන්ත්‍රී කනිමෝෂි කරුණානිධි මහත්මියද පසුගියදා නවදිල්ලියේදී හමුවිය.

පාර්ලිමේන්තු මන්ත්‍රිනී කනිමෝෂි කරුණානිධි තමිල්නාඩුවේ හිටපු මහ ඇමැති එම්. කරුණානිධි මහතාගේ දියණිය වන අතර වත්මන් මහඇමැති එම්.කේ. ස්ටාලින්ගේ සහෝදරියයි. ඉන්දීය පාර්ලිමේන්තුවේ මෝසම් සැසිවාරයට සහභාගී වීම සඳහා පැමිණි අතරවාරයේ කනිමෝෂි මහත්මිය මුණගැසුණු මහ කොමසාරිස්වරයා ශ්‍රී ලංකාවේ වත්මන් ආර්ථික තත්ත්වය කළමනාකරණය කර ගැනීම සඳහා ලබාදෙන මානුෂීය සහාය පිළිබඳව තමිල්නාඩු ජනතාව වෙනුවෙන් ශ්‍රී ලංකා රජයේ ස්තුතිය පුද කළේය.

තමිල්නාඩු ප්‍රාන්තය සහ ශ්‍රී ලංකාව අතර පවතින ඉතා සමීප ජනවාර්ගික, ආගමික සහ සංස්කෘතික බැඳීම් පිළිබඳව මහ කොමසාරිස්වරයා සහ ලෝක් සභා මන්ත්‍රී කනිමෝෂි කරුණානිධි මහත්මිය අදහස් හුවමාරු කරගත් අතර පවතින සබඳතා තවදුරටත් ශක්තිමත් කිරීමේ ක්‍රම සහ විධි පිළිබඳව අවධානය යොමු කළහ.

මහ කොමසාරිස් මොරගොඩ මහතා පාර්ලිමේන්තු මන්ත්‍රී කනිමෝෂි මහත්මිය වෙත සිය පාර්ලිමේන්තු කතා ඇතුළත් උණුසුම් හදවතක් කෘතියේ දෙමළ පරිවර්තනයේ පිටපතක්ද පිළිගැන්විය.